# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## Assignment for Vacation -2020
## තාක්ෂණවේදය සඳහා විද්‍යාව

නම / විභාග අංකය.................................................... **12 ශ්‍රේණිය**

### I - කොටස

(01) අජීවී සෛල වැඩිම ප්‍රතිශතයක් අඩංගු වනුයේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක ද?

1. ඵලය
2. පොත්ත
3. ද්විතියික ශෛලම
4. ද්විතියික ප්ලෝයම
5. අරටුව

(02) බොහෝ ද්විබීජ පත්‍රී කඳන් වල අන්තර් කලාප කැම්බියම,

1. ප්‍රාථමික විභාජකයකි
2. ද්විතියික සම්භවයක් සහිතයි
3. ස්ථර කිහිපයකින් සමන්විතය
4. ද්විතියික මජ්ජා කිරණ සාදයි
5. විශාල රික්තක සහිත මෘදුස්තර සෛල වලින් සමන්විතය

(03) නිවර්තන කලාපීය වනාන්තරවල පස සාමාන්‍යයෙන් පෝෂණ ද්‍රව්‍ය අතින් නිසරු වනුයේ,

1. වනාන්තර භූමියේ ඇති වියෝජනයවන පත්‍රවල ජෛව ස්කන්ධය අඩු නිසාය.
2. එම වනාන්තරවල පසෙහි ජීවත්වන ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාව අඩු නිසාය.
3. කාබනික ද්‍රව්‍ය වියෝජනය වීම ඉතා සීඝ්‍රයෙන් සිදුවන නිසාය.
4. පෝෂණ ද්‍රව්‍ය චක්‍රීකරණය වීම සාමාන්‍යයෙන් සෙමෙන් සිදුවන නිසාය.
5. අධික වර්ෂාපතනය මගින් පසේ පෝෂණ ද්‍රව්‍ය ක්ෂීරණය වීම නිසාය.

(04) කාර්මික ලෙස වයින් නිෂ්පාදනය කිරීමේදී භාවිතා කරනුයේ පහත දැක්වෙන කුමන ජීවියාගේ පරිවෘත්තීය ක්‍රියවන් ද?

1. *Acetobacter aceti*
2. *Lactobacillus bulgaricus*
3. *Aspergillus nigar*
4. *Saccharomyces cerevisiae*
5. *Streptococcus lactis*

(05) පහත සඳහන් ලක්ෂණ අතුරෙන් සියලුම බැක්ටීරියා, දිලීර හා වෛරසවලට පොදු වන්නේ කුමන ලක්ෂණ ද?

1. ප්‍රවේණික ද්‍රව්‍ය DNA වීම.
2. ප්‍රභාසංස්ලේෂණය නොකරන ජීවීන් වීම.
3. ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණයට නොහැකි වීම.
4. ජෛවගෝලය තුළ වඩාත්ම ව්‍යාප්ත වූ ජීවීන් වීම.
5. ශාකවල හා සතුන්ගේ රෝග විශාල සංඛ්‍යාවක් සඳහා හේතුකාරකයක් වීම.

(06) සෛලයක පහත සඳහන් ඉන්ද්‍රයිකා අතරෙන් කවරක් ලිපිඩ සංස්ලේෂණය සඳහා ඉවහල් වේද?

1. ගෝල්ගි දේහ
2. රළු අන්තඃප්ලාස්මීය ජාලිකා
3. සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා
4. ලයිසොසෝම
5. රයිබසෝම

(07) ජෛව විවිධත්වය සම්බන්ධයෙන් ඒක දේශික විශේෂය යනු,

1. එක් රටක පමණක් ස්වභාවිකව වැඩෙන විශේෂ වේ.
2. ජාතික වනෝද්‍යානවල ප්‍රමුඛ ලෙස සංරක්ෂණය කෙරෙණු විශේෂ වේ.
3. ඔවුන් ජීවත්වන පරිසර පද්ධතියේ ක්‍රියාකාරීත්වයට අත්‍යාවශ්‍ය වන විශේෂ වේ.
4. පාරිසරික දැනුවත්කම හෝ සංකෘතීය හෝ සංකේතවත් කරන විශේෂ වේ.
5. එක් ප්‍රදේශයක හැර අන් සියලුම ප්‍රදේශවලින් දේශගුණික විපර්යාසයන් නිසා තුරන් වූ විශේෂ වේ.

Not for Sale

(08) පහත දැක්වෙන ඒවා අතරෙන් කවරක් මුල් ස්ථානවලින් බැහැර සංරක්ෂණ ක්‍රමයක් සේ නොසැලකේ ද?

1. ජාන බැංකු පිහිටුවීම
2. වනෝද්‍යාන පිහිටුවීම
3. ජාතික උද්භිද උද්‍යාන පිහිටුවීම
4. අලි අනාතාගාර පිහිටුවීම
5. කැස්බෑ පැටවුන් බිහිකරන ස්ථාන පිහිටුවීම.

(09) අක්ෂිකා ඇත්තේ,

1. නිඩාරියාවන්ගේය
2. අනෙලිඩාවන්ගේය
3. ආත්‍රපොඩාවන්ගේය
4. මොලුස්කාවන්ගේය
5. ප්ලැටිහෙල්මින්තාවන්ගේය

(10) කාර්මික අප ජලය ප්‍රතිකාරක පිරියතක (ස්ථානයක) ද්විතියික ප්‍රතිකාරක අවධියේ ප්‍රධාන අරමුණ වන්නේ පහත දැක්වෙන ඒවා අතරෙන් කුමක් ද?

1. විෂලෝහ ඉවත් කිරීම
2. ව්‍යාධිජනකයින් විනාශ කිරීම
3. වැලි ඉවත් කිරීම
4. පාවෙන ද්‍රව්‍ය ඉවත් කිරීම
5. ක්ෂුද්‍රජීවී ඔක්සිකරණය මගින් රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD) අඩු කිරීම.

(11) පහත සඳහන් සෛලීය ඉන්ද්‍රියිකා අතරෙන් කවරක් පටලයකින් ආවරණය වී නැද් ද?

1. මයිටොකොන්ඩ්‍රියම
2. හරතලව ය
3. රයිබසෝම ය
4. ලියිසෝම ය
5. ගොල්ජි දේහය

(12) පහත සඳහන් කවර පදයක් වායුගෝලීය $CO_2$ තිරකරමින් අකාබනික රසායනික ද්‍රව්‍ය මගින් ශක්තිය ලබා ගන්නා ජීවීන් වඩාත්ම හොඳින් විස්තර කරයි ද?

1. රසායනික විෂමපෝෂීන්
2. රසායනික පෝෂීන්
3. රසායනික ස්වයංපෝෂීන්
4. ප්‍රභා ස්වයංපෝෂීන්
5. ප්‍රභා විෂමපෝෂීන්

(13) ශාකවල පහත සඳහන් ද්‍රව්‍යයන් අතුරෙන් කවරක් ප්‍රධාන වශයෙන් සංචිත කාර්යයක් ඉටුකරයි ද?

1. ග්ලූකෝස් ය
2. සෙලියුලෝස්
3. පිෂ්ඨය
4. පෙක්ටීන්
5. පොස්පොලිපිඩ

(14) පහත සඳහන් බැක්ටීරියා අතුරෙන් කුමකට වායුගෝලීය නයිට්‍රජන් $NH_4^+$ (ඇමෝනියම් අයන) බවට පත්කළ හැකි ද?

*1. Azotobacter*
*2. Nitrosomonas*
*3. Peseusomonas*
*4. Nitrobacter*
*5. Acetobacter*

(15) කාර්මික අප ජලය පිරිපහදු පිරියතක සක්‍රීය බොර පද්ධතියක් භාවිතා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ද?

1. ව්‍යාධි ජනක ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීමට
2. අප ජලයේ ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාව අඩු කිරීමට
3. බැර ලෝහ ඉවත් කිරීම
4. අප ජලයේ නයිට්‍රේට සහ පොස්පේට ඉවත් කිරීම.
5. අප ජලයේ ජෛව ඔක්සිජන් ඉල්ලුම අඩු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී ඔක්සිකරණයට උදව් කිරීම.

(16) වනාන්තර එළි කිරීම පහත සඳහන් ඒවා අතුරෙන් කවරකට අවම ලෙස බලපායි ද?

1. ජෛව විවිධත්වය
2. ගෝලීය උෂ්ණත්වය
3. වර්ෂාපතන රටාව
3. පාංශු pH අගය
5. ජලාශවල රොන්මඩ එකතුවීම.



Not for Sale

(17) සරු කෘෂිකාර්මික පස් ග්‍රෑම් 1ක පහත සඳහන් ක්ෂුද්‍රජීවී කාන්ඩ අතුරෙන් කවරක් උපරිම සංඛ්‍යා වලින් සිටුනු ඇත් ද?
1. දිලීර
2. සයනොබැක්ටීරියා
3. ඒක සෛලික ඇල්ගේ
4. බැක්ටීරියා
5. ප්‍රොටොසෝවා

(18) මෝරෙක්, මඩුවෙකුගෙන් වෙනස් වන්නේ,
1. ශ්වාස රන්ද්‍ර තිබීම මගින්
2. උදරීය මුඛයක් තිබීම මගිනි
3. උදරීය වරල් තිබීම මගිනි
4. පාර්ශ්වික ඇස තිබීම මගිනි
5. විසමාංශපුච්ඡ පෞච්ඡ වරලක් තිබීම මගිනි.

(19) ශ්‍රී ලංකාවේ වනාන්තර පරිසර පද්ධති විවිධත්වය කෙරෙහි බලනොපාන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ද?
1. උෂ්ණත්වය
2. උච්ඡත්වය
3. වර්ෂාපතනය
4. සුළඟ
5. අක්ෂාංශය

(20) ශ්‍රී ලංකාවේ නිවර්තන තෙත් සදාහරිත වනාන්තර පිළිබඳ නිවැරදි වනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. ශාකවල පැහැදිළි ස්ථරීභවනයක් ඇත.
2. ඒවායේ වියන අසන්තතිකය
3. හොඳින් වැඩුණු බිම් ස්ථරයක් ඇත.
4. ඒවායේ ප්‍රමුඛ ශාක වනුයේ සදාහරිත සහ පතනශීලී ගස්ය.
5. ඒවා පිහිටියේ 1200 – 2000 m වාර්ෂික වර්ෂාපතනයක් ඇති ප්‍රදේශවලය.

(21) සන්තතික වියනක් සහිත සදාහරිත ශාක ඇත්තේ පහත සඳහන් කුමන පරිසර පද්ධතියේ ද?
1. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර
2. කටු පඳුරු සහිත සදාහරිත ලඳු කැලෑ
3. කඳුකර වනාන්තර
4. නිවර්තන වැසි වනාන්තර
5. කඩොලාන වානාන්තර

(22) ධාවක මගින් ශාක ප්‍රචාරණය දක්වන ශාකයක් වන්නේ,
1. අන්නාසි
2. ගොටුකොළ
3. රතුළූණු
4. අක්කපාන
5. ගහල

(23) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සෛල වාදයෙහි ඇතුළත් නොවනුයේ කුමක්ද ?
1. සියලුම ජීවීන් සෛල එකකින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ.
2. ජීවීන්ගේ මූලික ව්‍යුහමය ඒකකය සෛලයයි.
3. ජීවීන්ගේ මූලික කෘත්‍යමය ඒකකය සෛලයයි.
4. සියලුම සෛල ඇති වනුයේ කලින් පැවති සෛල වලිනි.
5. සියලුම සෛල අන්වීක්ෂීය වේ.

(24) ස්ථුලකෝණාස්තර සෛල පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වනුයේ කුමක් ද?
1. ඒවා පරිණත අවස්ථාවේදී සජීවී වේ.
2. ඒවාට ඇත්තේ ප්‍රාථමික සෛල බිත්ති පමණි.
3. ඒවාට තවදුරටත් විභාජනය විය හැකිය.
4. ඒවා ප්‍රාථමික හා ද්විතියික ශාක දේහයන් හි දක්නට ඇත.
5. ඒවාට විසම ලෙස ඝන වූ සෛල බිත්ති ඇත.

(25) පහත දැක්වෙන සංයෝග අතුරෙන් සජීවී පදාර්ථයේ වඩාත්ම බහුල වනුයේ කුමක් ද?
1. කාබෝහයිඩ්රේට
2. ලිපිඩ
3. ප්‍රෝටීන
4. නියුක්ලෙයික් අම්ල
5. ජලය

Not for sale